**ශීර්ෂය 271 - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/ 2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය සහ 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) මෙම වාර්තාවේ 1.6.4 (අ) (i) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණය සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්තාවන් අනුව 2019 ජනවාරි 01 දිනට ජංගම නොවන වත්කම් රු.1,566,195,878 ක් වුවත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ එය රු.1,636,948,492 ක් ලෙස දක්වා තිබීම නිසා රු.70,752,614 ක වෙනසක් නිරීක්ෂණය විය. | භාණ්ඩාගාර පොත්වල දැක්වෙන ශේෂයන් සමඟ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් සමාන වී තිබිය යුතුය. | සිගාස් පද්ධතියේ සිදු වූ තාක්ෂණික දෝෂයක් වන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හරහා මෙම වත්කම්වල අගයන් වෙනස් වී ඇත. එය නිවැරදි කර ගැනීම සඳහා අවස්ථා ගණනාවකදී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ඇමුණුම්වල දැක්වෙන ලිපි මඟින් හා ප්‍රධාන ගණකාධිකාරි තුමා අවස්ථා කිහිපයකදී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හමු වී සාකච්ඡා කළත් මේ වන විටත් එය නිවැරදි කරගැනීමට නොහැකි වී ඇත. ඒ අනුව භාණ්ඩාගාර මුද්‍රිත වල දැක්වෙන අගයන් හා දිසාපති ලේකම් කාර්යාලයේ දැක්වෙන අගයන්වල වෙනසක් 2019 පෙබරවාරි මස සිට දක්නට ලැබේ. එනමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන අගයන් නිවැරදි බව දන්වමි |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 අනුව හඳුන්වාදී තිබුණු ආකෘතිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට අයත් මුදල් ප්‍රවාහ ප්‍රකාශය ACA – (C) ප්‍රකාර පිළියෙල නොකර 2018 වර්ෂයේ ගිණුම් ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට අයත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 අනුව හඳුන්වා දී තිබූ ආකෘතිය ප්‍රකාරව පිළියෙළ කළ යුතුවේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අයත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ACA © ප්‍රකාරව පිළියෙල කොට ඉතිරිපත් කර ඇති අතර, දැනට ඉතිරිපත් කර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශය මුළු අගයක් ලෙස ගත් කළ වෙනසක් සිදු නොවී ඇති බව දන්වා සිටිමි. |

### 1.6.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් මූල්‍ය පාලනයේ සඵලදායිත්වය පිළිබඳ නිරන්තරයෙන් පරීක්ෂාවට භාජනය කරනු ලබන බවත් ඒ සඳහා මුදල් රෙගුලාසි යටතේ බලතල පැවරීම, ස්ථාවර නියෝග සඳහා ගෙවීම් පටිපාටිය අභ්‍යන්තර ක්‍රියාකාරී විගණන සැලැස්ම සහ ස්ථාවර නියෝග සඳහා ගෙවීම් පටිපාටියේ සංශෝධනයන් භාවිතා කරන බව. |

### 1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | රු. | | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | | |
| (i) XIX පරිච්ඡේදයේ 5.2.1 ඡේදය | 825,600 | විධිවිධාන පරිදි නිවාස කුලි අයකර නොතිබුණි. | විධිවිධාන ප්‍රකාරව නිවාස කුලී අයකල යුතු වීම. | මෙම රජයේ ගොඩනැගිලි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් බවත් එහි නිවාස කුලී අයකිරීම පිළිබඳව කටයුතු කිරීම හෝ අවශ්‍ය පරිදි නීතිමය පියවරවලට එලබීම එම |

| | | | | |
|---|---|---|---|---|
| | | | | දෙපාර්තමේන්තුවට අයත් කාර්යයක් වන බැවින් එය මෙම කාර්යාලයේ විෂය පථයට අදාල නොවන බව දන්වා සිටිමි. |
| (ii) XXIV පරිච්ඡේදයේ 3.5 ඡේදය | 750,000 | වැටුපෙන් අනුමත මාසික අඩු කිරීම් සීමාව සියයට 40 ඉක්මවා තිබුණු නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින් වෙත සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 03 කදී ආපදා ණය ගෙවා තිබුණි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී නිවැරදි ලෙස කටයුතු කරන බව |
| (ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2013 ඔක්තෝම්බර් 07 දිනැති අංක 21/2013 දරණ චක්‍රලේඛයේ 2(අ) ඡේදය | 614,608 | රජයේ නිවාඩු දිනවල වැඩ කරන නිලධාරීන් දිනකට පැය අටකට නොඅඩු කාලයක් රාජකාරි කළ යුතු වුවත්, ඇඟිලි සටහන් යන්ත්‍රය අනුව දිනකට පැය අටකට අඩු කාලයක් රාජකාරි කර තිබුණු නිලධාරීන් එකොළොස් දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේ නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. | ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් වී ඇති වේලාවන් පදනම් කරගෙන ගෙවීම් කළ යුතු වේ. ඇඟිලි සලකුණු යන්ත්‍රයේ දෝෂ ඇත්නම් ප්‍රමාද නොකර යථා තත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කළ යුතුය. | දෛනික පැමිණීමේ ලේඛණය පදනම් කරගෙන නිවාඩු දින වැටුප් ගෙවා ඇති බව. |
| (ඇ) 2019 දෙසැම්බර් 04 දිනැති මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ 07/2019 චක්‍රලේඛය | 1,753,035 | රාජ්‍ය වියදම් කලමනාකරණ සහ මුල්‍ය විනය පවත්වාගෙන යාම යටතේ නව වාහන මිලදී ගැනීම, කාර්යාල උපකරණ මිලදී ගැනීම සහ ගොඩනැගිලි කුලියට ගැනීම් සිදු | චක්‍රලේඛ උපදෙස් පරිදි රාජ්‍ය වියදම කළමනාකරණය කිරීමට ක්‍රියා කළ යුතුය. | එදිනෙදා කටයුතු පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදී ගත් බව. |

| | | | |
|---|---|---|---|
| | නොකළ යුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේදී කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි. | | |
| (ඇ) වත්කම් කළමනාකරණ චක්‍රලේඛ<br>-----------------<br>2017 - දෙසැම්බර් 21 දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අංක 02/2017 දරන චක්‍රලේඛය | මුතූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන වාහන හතක ලියාපදිංචි අයිතිය එම ආයතනය සතුව නොතිබූ අතර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ලියාපදිංචි අයිතිය ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි. | අදාළ චක්‍රලේඛ පරිදි ක්‍රියාකළ යුතු වේ. | ඉදිරියේදී චක්‍රලේඛ පරිදි ක්‍රියා කරන බව. |

## 1.6.5 අනුමත නොකල ගනුදෙනු

-------------------------------

| **විගණන නිරීක්ෂණය**<br>-------------------------- | **නිර්දේශය**<br>------------- | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>------------------------------- |
|---|---|---|
| ඇස්තමේන්තු වටිනාකම රු.71,440,000 ක් වූ නීලපනිච්චන්කුලම වැව ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාළ ලංසු ලියකියවිලි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණ ඇගයීම් කමිටු විසින් අනුමත කර නොතිබුණි. | ලංසු ලියකියවිලි ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් අනුමත කළ යුතුය. | මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් අනුමත කර ඇති බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ අක්මුදල් නිදහස් කිරීමේදී භාණ්ඩාගාරය විසින් ලබා දෙන උපදෙස් ලිපි වලට අනුව **(advice of the release of imprest)** ලබාදෙනු ලබන අක් මුදල් අදාළ අරමුණු සඳහා පමණක් යොදා ගත යුතු අතර වෙනත් වියදම් හෝ අරමුණු සඳහා යොදා නොගත යුතුය. නමුත්, ජනාධිපති ලේකම් කාර්යාල වැය ශිර්ෂ අංක 01 සඳහා ලැබුණු අක් මුදල් ඉක්මවා රු.96,117,643 ක් වියදම් කර තිබුණු අතර, වැය ශීර්ෂ අංක 104 ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු සහ පුනරුත්තාපන, නැවත පදිංචි කිරීම් අමාත්‍යංශයෙන් ලැබුණු අක් මුදල් වලින් රු.80,236,658 ක් අදාළ වැය ශිර්ෂයෙන් අපේක්ෂිත අරමුණට බැහැර කාර්යයන් සඳහා වියදම් කර තිබුණි. | ලැබෙන අක් මුදල් අදාළ කාර්යය සඳහා පමණක් යෙදවීමට අවධානය යොමුකළ යුතු වේ. | ප්‍රමුඛත්වය සහ ව්‍යාපෘති අඛණ්ඩව කර ගැනීමේ අවශ්‍යතාවය මත සැපයුම්කරුවන් මුදල් ගෙවීම සඳහා වෙනත් ප්‍රවාහ වලින් ලද මුදල් යොදා ගත් බව. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූලධන වැය විෂයන් පහක් සඳහා වෙන්කරන ලද රු.26,450,000 ක ප්‍රතිපාදනවලින් රු.9,204,641 ක් පමණක් වියදම් කිරීම නිසා රු.17,245,359 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. මේ නිසා එම ප්‍රතිපාදන ඉතිරි කිරීම සියයට 100 සිට සියයට 42 දක්වා පරාසයක විහිදී තිබුණි. | සැලසුම්ගත කාර්යයන් ප්‍රමාදයකින් තොරව ඉටුකිරීම හා විධිමත් අයවැය පාලනයක් පවත්වා ගත යුතු වීම. | අග්‍රිම නොලැබීම හේතුවෙන් මූලධන ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දී වෙනත් මූලධන වැය විෂය 271-1-1-0-2509 සඳහා 2019 ඔක්තෝම්බර් 15 දින රු.1,350,000 ක පරිපූරක ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණද එම ප්‍රතිපාදන වියදම් නොකර සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි. | විධිමත්ව සැලසුම්කරන ලද ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන අනුමත කරවා ගැනීම. | අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නැවත්වීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 208 අනුව තම දෙපාර්තමේන්තුවට වෙන්කර දෙන ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කිරීම සෑම ගණන්දීමේ නිලධාරියාගේම වගකීම් වුවත්, වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු 8 ක් විසින් දිස්ත්‍රික් ලේකම් වෙත වෙන්කර ලබා දී තිබුණු රු.897,386,975 ක ප්‍රතිපාදන වලින් රු.485,996,867 ක් පමණක් වියදම් කිරීම නිසා එම ප්‍රතිපාදන වලින් රු.411,390,108 ක් ඉතිරි කර තිබුණි. එම ප්‍රතිපාදන ඉතිරි කිරීම සියයට 67 සිට සියයට 31 ක දක්වා පරාසයක විහිදී තිබුණි. | ලැබෙන ප්‍රතිපාදනවලින් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකිවන සේ කටයුතු සැලසුම් කල යුතුවේ . | භාණ්ඩාගාරයෙන් ඉල්ලන ලද ප්‍රතිපාදන නොලැබීම නිසා ප්‍රතිපාදන ඉතිරි වීම සිදු වී ඇති බව . |

## 2.4 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අප්‍රේල් 18 දිනැති අංක 24/2017 දරන දේශීය ආදායම් පනතේ 85 වගන්තිය අනුව 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය වෙනුවෙන් සේවා නියුක්තිකයන්ගෙන් අයකර ගත යුතුව තිබුණු රු.176,567 ක උපයන විට බද්ද ඔවුන්ගෙන් අයකරගෙන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යවා නොතිබුණි. | දේශීය අදායම් පනත ප්‍රකාරව අදාළ කාල සීමාව සඳහා උපයනවිට ගෙවීම් බදු අයකළ යුතුවේ. | 2018 වර්ෂයේදී නිකුත් කරන ලද දේශීය ආදායම් පනත රාජ්‍ය අංශ නිලධාරීන්ට අදාළ කර ගැනීමේදී යම් යම් ගැටළු සහගත තත්ත්වයන් පැවතීම නිසා උපයන විට ගෙවීම් බදු අයකරගෙන නොමැති බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ නිවාසලාභීන් ලෙස අනු පවුල් තෝරා ගැනීමේදී 2019 ජනවාරි 12 දිනැති බන්ධනාගාර, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශ ලේකම්ගේ අංක PH/NECA/2019 | අදාළ චක්‍රලේඛ උපදෙස් පරිදි ක්‍රියා කළ යුතුය. | කමිටු නිර්දේශ මත අදාල ප්‍රතිලාභීන් තෝරා ගත් බව. |

| | | | |
|---|---|---|---|
| | -01 දරණ ලිපිය හා 2016 සැප්තැම්බර් මාසයේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් විසින් නිකුත් කරන ලද අංක GAT/EST/RESET/Hou/VOL-II/2016 දරණ ලිපි වලට අනුව නැවත පදිංචි වීමට පෙර විවාහ වූ අය අනු පවුල් ලෙස තෝරා ගත යුතු අතර යුද්ධය හෝ ආශ්‍රිත හේතුමත අබාධිත වුවන් තෝරා ගත යුතු විය. එහෙත් නගර සහ කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාලව නැවත පදිංචි වීමෙන් පසු විවාහ වූ පුද්ගලයින් සහ ස්වාභාවික වෙනත් හේතු මත අබාධිත වුවන්ද ප්‍රතිලාභීන් ලෙස තෝරාගෙන තිබුණි. | | |
| (ආ) | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් සහ පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ තරුණ කටයුතු අමාත්‍යාංශයෙන් 2016, 2017, 2019 වර්ෂවලදී ලබා දී තිබුණු ප්‍රතිපාදන වලින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ යුද්ධයෙන් අවතැන් වී නැවත පදිංචි වන පවුල් වෙත රු.මිලියන 2,150 ක් වැයකර නිවාස ඉදිකිරීමේ සහ ජීවනෝපාය සහය සඳහා අරමුදල් ලබාදීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘති සම්බන්ධයෙන් කින්නියා, මුතූර්,තඹලගමුව සහ වෙරුගල් යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාලව සිදුකළ නියැදි විගණන පරීක්ෂාවන් අනුව නව නිවාස ඉදිකිරිම සහ ජීවනෝපාය සහය ව්‍යාපෘති සඳහා යුද්ධය අවසන් වී වර්ෂ 10 ක් ගතවී ඇතත් ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වයේ සැලකිය යුතු වර්ධනයක් සිදු වී නොතිබුණි. | නැවත පදිංචි වන පවුල් වෙනුවෙන් නිවාස ලබා දීම සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇතත් එම අරමුණින් බැහැරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම ඉකුත් වර්ෂ 10 ක කාලය තුළ සිදු වී ඇති බැවින් අරමුණුවලට අනුකූල වන පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ක්‍රියාකළ යුතුය. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව තෝරා ගැනීමේ කමිටු මඟින් ප්‍රතිලාභීන් තෝරාගෙන ඇති බවත් භාවිතා නොකරන නිවාස භාවිතා කිරීම සඳහා අදාල ප්‍රතිලාභීන් වෙත දන්වා ඇති බවත් ජීවනෝපාය ව්‍යාපෘති පිළිබඳ හැකි හැම අවස්ථාවකම ප්‍රාදේශීය ලේකම් වරුන් විසින් පසු විපරම් කටයුතු සිදු කරන බවත් දිස්ත්‍රික්කයේ පවතින නිවාස අවශ්‍යතාවන් සැපිරීමට ප්‍රමාණවත් අරමුදල් ලැබී නොමැති බවත් යන කරුණු නිසා මෙම ව්‍යාපෘතිය තිරසාර සංවර්ධන අරමුණු කරා ලඟා වීමට නොහැකි වී ඇති බව. |
| (ඇ) | නගර සහ කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නැවත පදිංචි කිරීමේ නිවාසලාභින් තෝරා ගැනීම වෙනුවෙන් පත්කර තිබුණු කමිටු සාමාජිකයින් අභියාචනා කමිටු සාමාජිකයින් ලෙසද පත්කර තිබීම නිසා ප්‍රතිලාභීන් තෝරා ගැනීම සාධාරණ සහ නිවැරදිව සිදු වී ඇතිද යන්න ප්‍රශ්නගත කරුණක් විය. | අභියාචනා සම්බන්ධව ක්‍රියා කිරීමට වෙනත් කමිටුවක් පත්කළ යුතුවේ. | ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා හෝ පත්කළ කමිටුව විසින් අභියාචනා ඇගයීම සිදුකල බව. |

## 3.2 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නීල පනිච්චිකුලම වැව ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම ව්‍යාපෘතිය සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.11 (අ) ඡේදයට අනුව සරලානුකූලව ප්‍රතිචාර දක්වන අවම මිල සහිත ලංසු තේරීමේදී, තීරණාත්මක හෝ ඉතා වැදගත් අයිතමයන් පිළිබඳව ලංසුකරු විසින් තාත්වික අඩු අනු ප්‍රමාණයන් සඳහන් කර ඇති නම් තාක්ෂණික ඇගයීම් කමිටුව ඒ පිළිබඳ සෑහීමකට පත් වී කොන්ත්‍රාත්කරු තෝරාගත යුතු විය. එහෙත් ඇස්තමේන්තු වටිනාකම රු.55,000,000 ක් වූ නීලපනිච්චම්කුලම වැව ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු තෝරා ගැනීමේදී ඒ පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි. තවද, පූර්ව කොන්ත්‍රාත් සුදුසුකම් සපුරා නොතිබීම නිසා කොන්ත්‍රාත්කරු තමාට වාසිදායක අයිතම පමණක් ඉටුකර කොන්ත්‍රාත්තුව ඉටු කිරීම සියයට 98 ක්ම පැහැර හැර තිබුණි. | කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම නිවැරදිව සිදුකළ යුතු අතර, ගිවිසුම් කාල සීමාව තුල වැඩ අවසන් වී තිබිය යුතුය. | කොන්ත්‍රාත්කරුගේ මිල ගණන් සාධාරණ බව සහ දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු මිල ගණන් පදනම් කරගෙන තාක්ෂණ හා ප්‍රසම්පාදන කමිටුව ඇගයීම් සිදු කළ බව. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පාවිච්චිය අත්හැර දමන ලද වාහන සම්බන්ධයෙන් 2015 ජුලි 10 දිනැති අංක 02/2015 රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන චක්‍රලේඛය ප්‍රකාරව අපහරණ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ 2016 වර්ෂයේ සිට තිබෙන වාහන 06 ක් සම්බන්ධයෙන් එසේ ක්‍රියාකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | අදාළ චක්‍රලේඛ උපදෙස් පරිදි අපහරණ කටයුතු කඩිනමින් අවසන් කිරීමට ක්‍රියාකළ යුතු වේ. | ඉදිරි කාලයේදී මෙම වාහන සම්බන්ධයෙන් ක්‍රියාකර අවසන් කරන බව. |

**3.4 කළමනාකරණ දුර්වලතා**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවා කාලය වර්ෂ 05 ක් ඉක්මවා සිටින නිලධාරීන් සම්බන්ධයෙන් ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර නොතිබීම නිසා නගරයෙන් දුර බැහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දීර්ඝ කාලයක සිට ස්ථානමාරු අපේක්ෂාවෙන් සිටින නිලධාරීන්ට අසාධාරණයක් සිදු වී තිබුණි. | ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතු වේ. | වර්ෂ 5 කට වඩා සේවා කාලයක් ඇති නිලධාරීන් ස්ථානමාරු කිරීමට ක්‍රියාකරමින් සිටින බව. |
| (ආ) | 2012 දෙසැම්බර් 17 දිනැති අංක 1789 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය සහ 2018 දෙසැම්බර් 31 දිනැති අංක 2014/05 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නිකුත් කර තිබුණු මත්පැන් බලපත්‍ර සඳහා 2018 හා 2019 වර්ෂ වෙනුවෙන් අයකළ යුතු මුද්දර ගාස්තු රු.114,000 ක් අයකර නොතිබුණි. | අදාළ ගැසට් පත්‍රයේ සඳහන් පරිදි අය කිරීම් කළ යුතු වේ. | අදාළ ගැසට් පත්‍රයේ සඳහන් පරිදි මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. |
| (ඇ) | 2002 සිට 2014 දක්වා කාලය තුල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහන 7 කට සිදු වී තිබුණු අනතුරුවල වටිනාකම රු.2,472,079 ක් ලෙස ගණනය කර තිබුණු නමුත් අදාළ පරීක්ෂණ කටයුතු ප්‍රමාදවීම නිසා අදාල වටිනාකම අයකිරීමට කටයුතු සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | මෙම අනතුරු සිදු වී දීර්ඝ කාලයක් ගත වී ඇති බැවින් අදාළ අයකිරීම් සිදු කිරීම සහ අලාභ කපාහැරීම් කඩිනමින් අවසන් කිරීමට ක්‍රියාකළ යුතු වේ. | මෙම අනතුරු වලට අදාළ ඇතැම් ලේඛන සොයා ගැනීමේ අපහසුතා පවතින අතර වගකිව යුතු පාර්ශව වෙතින් අයකිරීම් සිදු කරමින් පවතින බව සහ අලාභ සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග සඳහා අමාත්‍යාංශ වෙත යොමුකර ඇති බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මාර්තු සිට 2020 මාර්තු දක්වා කාලයට අදාළ වන දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ රු.1,350,260 ක ඇමදුම් සේවා වියදම් (271-01-01-1303) රජයේ ගොඩනැගිලි කුලී ආදායමෙන් (2002-01-01) ගෙවීම නිසා ඇමදුම් සේවා වියදම මෙන්ම රජයේ ගොඩනැගිලි කුලී ආදායමද රු.1,350,260 කින් අඩුවෙන් දැක්වීමක් සිදු වී තිබුණි. | රාජ්‍ය අදායම හා වියදම් නිවැරදි ප්‍රමාණය ගිණුම්ගත කිරීමට ක්‍රියාකළ යුතු වේ. | ලැබුණු ගොඩනැගිලි කුලී ආදායම් ඇමදුම් සේවා වියදම් සඳහා යොදවා ගත් බව. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසාර ඉලක්කයන් පිළිබඳ නිලධාරින් ප්‍රමාණවත් පරිදි දැනුවත් වී නොතිබුණු අතර තිරසාර සංවර්ධන ඉලක්කයන්ද හඳුනා ගැනීම සිදුවී නොතිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ අදාල ඉලක්කයන් සපුරා ගැනීම පිළිබඳ ඇගයීමක් කිරීමට නොහැකි වී තිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්කයන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතු වේ. | අභ්‍යන්තර පාලන පද්ධතිය වඩාත් විධිමත් කිරීමටද, නිලධාරින් වෙනුවෙන් ධාරිතා පුහුණු වැඩසටහන් පවත්වා සම්පත් පූර්ණ උපයෝජනය මෙන්ම මනා ලෙස කළමනාකරණය කිරීමටද රාජ්‍ය අංශයේ පවතින නෛතික රාමුව තුළ විනිවිදභාවයෙන් යුතුව කටයුතු කිරීමට අවශ්‍ය පරිසරය ශක්තිමත් කිරීමට ද පියවර ගෙන ඇත. එමගින් තිරසාර සංවර්ධන ඉලක්ක වෙත ප්‍රවේශ වීමට අවශ්‍ය පසුබිම සකසා ඇති බව අවධාරණය කරමි. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජ්‍යේෂ්ඨ මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 20 ක්ද තෘතික මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 19 ක්ද ද්විතික මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 186 ක් හා ප්‍රථමික මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 32 ක්ද වශයෙන් මුළු පුරප්පාඩු ප්‍රමාණය 257 ක් තිබුණි. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට අවධානය යොමු කර ඒවා පිරවීමට කටයුතු කළ යුතුය. | තනතුරු පුරප්පාඩු සම්බන්ධයෙන් අදාළ ආයතන වෙත දන්වා යවා ඇති බව. |